# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1879/15 - 2014 සැප්තැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2014.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/22/08/2012

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.09.06 දිනැති හා අංක 1826/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2013.08.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බදුල්ල, ආර්. එච්. ගුණවර්ධන මාවත, අංක 15A/24 හි පදිංචි ඩී. බී. දිසානායක මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.08.12 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
*වැඩබලන-කම්කරු කොමසාරිස්.*

2014 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය :* IR/22/08/2012.

**කාර්මික අධිකරණයේ දී ය**

*එක් පාර්ශ්වයක් වශයෙන්*

ඩී. බී. දිසානායක මයා,
අංක 15A/24,
ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල.

එදිරිව

නඩු අංකය : ඒ/3521 — *අනෙක් පාර්ශ්වය වශයෙන්*

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

වගඋත්තරකාර පාර්ශ්වය

**ප්‍රදානය**

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදාන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2013.08.23 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ -

"ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයේ නියුතු ඩී. බී. දිසානායක මහතාට 2002.09.11 වැනි දින සිට I වන ශ්‍රේණියේ


1 A – G 20239— 15 (2014/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලිපිකරු තනතුර ලබා නොදීමෙන් ඔහුට යම් ආසාධාරණයක් සිදු වූයේ ද යන්න සහ එසේ අසාධාරණයක් සිදු වූයේ නම් ඔහුට ලබා දිය යුතු සහන කවරේද යන්න" පිළිබඳ වේ.

ඉල්ලුම්කරු පළමු ප්‍රකාශය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බේරුම්කරණයට පාර්ශ්වයන් කැඳවීමෙන් පසුව දෙවන පාර්ශ්වය සිය පළමු ප්‍රකාශය ගොනු කරන ලදී. ඉන් අනතුරුව ඉල්ලුම්කරු දෙවන ප්‍රකාශයක් ද ගොනු කරන ලදී. එම ප්‍රකාශය ගොනු කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය සිය පිළිතුරු ප්‍රකාශය සංශෝධනය කල යුතු බවට දැනුම් දීමෙන් අනතුරුව ඊට ඉඩ දෙන ලදී. ඉන් අනතුරුව ඉල්ලුම්කරුද සංශෝධිත දෙවන ප්‍රකාශයක් ගොනු කරන ලදී.

ඉල්ලුම්කරු මෙම ආරවුල ආරම්භ කරමින් සාක්ෂි මෙහෙයවන ලදී. ඉහත පරිදි සාක්ෂි මෙහෙයවමින් තිබියදී දෙවන පාර්ශ්වය සමථයක් පිළිබඳව කොන්දේසි බේරුම්කරණයට 2014.06.10 වැනි දින ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ඉල්ලුම්කරුට 2005.12.30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි I වන ශ්‍රේණියේ පිහිටුවිය හැකි බව දැනුම් දෙන ලදී. ඉහත සමථය පිළිබඳව සලකා බැලීම සඳහා ඉල්ලුම්කාර පාර්ශ්වයට දිනයක් ලබා දුන් අතර, ඒ අනුව මෙම ආරවුල 2014.07.01 වැනි දින කැඳවීමට නියම කරන ලදී.

ඉහත දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේදී වගඋත්තරකරු යෝජනා කරන ලද 2005.12.30 වැනි දින සිට I වන ශ්‍රේණිය ලබා ගැනීමට එකඟ වන බව ඉල්ලුම්කරු බේරුම්කරණයට දැනුම් දෙන ලදී. ඒ අනුව අදාළ සමථය පිළිබඳව එකඟතාවය පළ කිරීමෙන් අනතුරුව දෙපාර්ශ්වය විසින් එදින නඩු ගොනුවට අත්සන් තබන ලදී.

ඉහත සමථය පරිදි ඉල්ලුම්කරුට හිමි හිඟ වැටුප්, වැටුප් වර්ධක ඇතුළු සියලුම හිමිකම් මෙම සමථය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව මාස 02ක් ඇතුළත දී ගෙවිය යුතු ය.

ඒ අනුව ඉහත සමථය සාධාරණ සහ යුක්තිසහගත වන බව මම නිගමනය කරමි.

පාලිත වීරසේකර,
(බේරුම්කරු.)

2014 අගෝස්තු මස 12 වැනි දින.

09-1107